

# කාර්ය සාධන වාර්තාව හා ගිණුම් - 2014

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## කුරුණෑගල



## පටුන


| අංකය | පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|---|
| **1** | **හැදින්වීම** | | 1 |
| 1.1 | දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ පණිවිඩය | | 1 |
| 1.2 | දැක්ම | | 2 |
| 1.3 | මෙහෙවර | | 2 |
| 1.4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු | | 2 |
| 1.5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන් | | 2 |
| 1.6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තත්ව ප්‍රතිපත්තිය | | 3 |
| 1.7 | පාලිත ආයතන | | 3 |
| 1.8 | දිස්ත්‍රික්කයේ තොරතුරු | | 4 |
| 1.9 | දිස්ත්‍රික් සැලැස්ම | | 5 |
| 1.10 | කාර්ය මණ්ඩල සැකැස්ම | | 6 |
| **2** | **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවා** | | **7** |
| 2.1 | ආයතන අංශය | | 7 |
| 2.2 | ගිණුම් අංශය | | 7 |
| 2.3 | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය | | 7 |
| 2.4 | පුපුරණ ද්‍රව්‍ය අංශය | | 16 |
| 2.5 | ප්‍රවෘත්ති අංශය | | 16 |
| 2.6 | දිස්ත්‍රික් දිවිනැගුම අංශය | | 17 |
| 2.7 | සමාජ ආරක්ෂණ අංශය | | 20 |
| 2.8 | මිණුම් ඒකක ප්‍රමිති සේවා අංශය | | 21 |
| 2.9 | වෘත්තීය මාර්ගෝපදේශන අංශය | | 21 |
| 2.10 | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | | 21 |
| 2.11 | සංඛ්‍යා ලේඛණ අංශය | | 22 |
| 2.12 | ජාතික පොහොර ලේකම් කාර්යාලය | | 24 |
| 2.13 | රාජ්‍ය නොවන සංවිධාන අංශය | | 24 |
| 2.14 | සංස්කෘතික අංශය | | 24 |
| 2.15 | බෞද්ධ කටයුතු අංශය | | 25 |
| 2.16 | සමාජ සේවා අංශය | | 25 |
| 2.17 | උපදේශන සේවා අංශය | | 26 |
| 2.18 | ආපදා කළමණාකරන සම්බන්ධීකරණ අංශය | | 26 |
| 2.19 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | | 26 |
| 2.20 | පාරිභෝගික අධිකාරිය | | 27 |
| 2.21 | මෝටර් රථ අංශය | | 27 |
| 2.22 | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය | | 28 |
| 2.23 | අභ්‍යන්තර විගණන අංශය | | 28 |
| 2.24 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය | | 29 |
| 2.25 | වනිතා සංවර්ධන අංශය | | 29 |
| 2.26 | ඉංජිනේරු අංශය | | 29 |
| 2.27 | රැකියා සේවා මධ්‍යස්ථානය | | 30 |
| 2.28 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | 31 |
| **3** | **මූල්‍යමය කාර්ය සාධනය** | | **33** |
| 3.1 | වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්වීම | | 33 |
| 3.2 | ප්‍රතිපාදන වලට එරෙහි වියදම | | 33 |
| 3.3 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 27201 | | 34 |
| 3.4 | පොදු තැන්පත් | | 35 |
| 3.5 | ආදායම් ගිණුම | | 35 |
| 3.6 | භාණ්ඩාගාර අග්‍රිම ගිණුම | | 35 |
| 3.7 | රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | | 36 |
| 3.8 | සමාප්තිය | | 36 |
| | උපලේඛණ 02 | | 37 |
| | උපලේඛණ 03 | | 38 |
| | ඩී.ජී.එස්.ඒ. | 2 | 40 |
| | ඩී.ජී.එස්.ඒ. | 3 | 41 |
| | ඩී.ජී.එස්.ඒ. | 4 | 42 |
| | ඩී.ජී.එස්.ඒ | 5 | 44 |
| | ඩී.ජී.එස්.ඒ | 5 (i) | 45 |

# 1.1 දිස්ත්‍රික් ලේකම්/දිසාපතිගේ පණිවිඩය........



කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 වසර සඳහා වූ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව ඉමහත් සතුටින් යුතුව ඔබ වෙත ඉදිරිපත් කරමි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කින් සමන්විත විශාලතම පරිපාලන දිස්ත්‍රික්කය වන කුරුණෑගල දිස්ත්‍රික්කය, විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ අත්වැල් බැඳගනිමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් 2014 කාර්ය සාධන හා ගිණුම් වාර්තාවෙන් ඔබ සුරතට පත් කරන්නට ලැබීම මහත් සතුටකි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම සමඟ ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනේ අප වෙත මහා භාණ්ඩාගාරය 2014 වසර වෙනුවෙන් වෙන් කර දුන් ප්‍රතිපාදන හා අක්මුදල් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉතා පරිස්සමෙන් සහ ඵලදායී ලෙස යොදා ගත් ආකාරය මෙයින් මනාව නිරූපණය වේ. මේ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ අනෙකුත් සේවා සපයන ආයතන හා නිලධාරීන් ඉමහත් කැපවීමෙන් කටයුතු කල බවත් මෙහිදී මතක් කල යුතුයි.

මහින්ද චින්තන ඉදිරි දැක්මට සමගාමීව කුලියාපිටියේදී පවත්වන්නට යෙදුන "දැයට කිරුල" විශේෂ වැඩසටහන් තුලින්, කුරුණෑගල දිස්ත්‍රික්කය දැයේ කිරුළ පලන්දන්නට 2014 වර්ෂයේ දී හැකි වීම මෙහි ලා සඳහන් කළ යුතුමය. දිවිනැඟුම, ගමනැඟුම, පලාත් නැගුම, මිස්සක ඉ නැණසල, ඉසුරුමත් මව්බිමක් අසිරිමත් නිවහනක් හා සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කරමින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය භාර්ය අප විසින් මනාව ඉටු කල ආකාරය සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් පිළිබඳව ද මෙහි අන්තර්ගතය පෝෂණය කරයි.

මෙම දිස්ත්‍රික්කයේ ජනතාව තෘප්තිමත් කරමින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කර ගනිමින් අප යන ගමන් මගට අත්වැලක් වෙමින් අපට සහයෝගය දුන්, උපදෙස් ලබා දුන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, අනෙකුත් සියළුම රාජ්‍ය ආයතනයන්හි නිලධාරීන්ටත්, සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්ටත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාගේ සියළුම කාර්ය මණ්ඩලයටත් මගේ හදපිරි ස්තූතිය මෙයින් පිරිනමමි.

එච්.එම්.පී.හිටිසේකර

කුරුණෑගල දිසාපති / දිස්ත්‍රික් ලේකම්

<u>**කාර්යය සාධන වාර්තාව හා ගිණුම් - 2014**</u>

භාණ්ඩාගාර ලේකම්ගේ අංක පී.එෆ්/එෆ්.එස්/03 (xiv) හා 2002 සැප්තැම්බර් මස 12 වන දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 අනුව, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා වූ කාර්යය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල**

**1.2** දැක්ම

පුරවැසි තෘප්තිය සඳහා වූ විශිෂ්ඨ රාජ්‍ය සේවාවක්.

**1.3** මෙහෙවර

**රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව සැලසුම් සහගතව සම්පත් හා ආයතන ඵලදායි ලෙස කළමණාකරනය කරමින් පුරවැසි අවශ්‍යතා තෘප්තිමත් කරන තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.**

දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි, තිරසාර සංවර්ධනයක් උදෙසා, රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වූ මනා සැලැස්මකින් යුතුව, සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙයවන්නා වූ සම්බන්ධීකරණයක් තුලින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව සාධාරණව යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙවරයි.

**1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු**

- රජයේ නියෝජිත ආයතනයක් වශයෙන් විවිධ අණපනත් වලින් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම තුලින් ජනතා අභිලාෂයන් හා අපේක්ෂාවන් ඉටු කිරීම.
- දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා මානව මූලා හා භෞතික සම්පත් කාර්යක්ෂමව මෙහෙයවීම.

**1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන්**

- රජයේ සංවර්ධන වැඩ සටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කටයුතු සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.
- ව්‍යවස්ථාපිත අණපනත් වලින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.
- වෙනත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල දිස්ත්‍රික් නියෝජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කය තුල නීතිය හා සාමය පවත්වාගෙන යාමටත් ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ආරක්ෂක අංශය සමඟ මනා සබඳතාවයක් පවත්වා ගැනීම.
- රාජ්‍ය ආදායම ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ආදායම

එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## 1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තත්ව ප්‍රතිපත්තිය

රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මානව, භෞතික මූල්‍ය සම්පත් ඵලදායිවත්, කාර්යක්ෂමවත් යොදා ගනිමින් අපගේ පුරවැසි ප්‍රඥප්තියට අනුකූලව එකිනෙකාගේ තත්ව පරිපාටි පිළිබඳව මනා අවබෝධයෙන් යුතුව, ක්‍රියාකාරී සහභාගිත්වයෙන් දිස්ත්‍රික්කයේ පුරවැසියන් හට තෘප්තිමත් හා විශිෂ්ටවුත් ගුණාත්මක සේවාවක් නිරන්තර වැඩිදියුනු කරමින් අඛන්ඩව ලබාදීම අපගේ තත්ව ප්‍රතිපත්තියයි.

## 1.7 පාලිත ආයතන

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ මහ පෙන්වීම, අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල පහත සඳහන් ආයතන හා අංශ ක්‍රියාත්මක වේ.

- ආයතන අංශය
- ගිණුම් අංශය
- ඉංජිනේරු අංශය
- දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- සමෘද්ධි අංශය
- සංස්කෘතික අංශය
- බෞද්ධ කටයුතු අංශය
- සමාජ ආරක්ෂණ අංශය
- ප්‍රවෘත්ති අංශය
- මිණුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය
- ආපදා කළමනාකරණ අංශය
- වෘත්තීය මාර්ගෝපදේශ අංශය
- සමාජ සේවා අංශය
- මානව සම්පත් හා ඵලදායිතා ප්‍රවර්ධන අංශය
- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය.
- සංඛ්‍යා ලේඛණ අංශය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක්
- මෝටර් රථ අංශය
- පුපුරණ ද්‍රව්‍ය අංශය
- ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
- ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය
- වනිතා සංවර්ධන අංශය

## 1.8 දිස්ත්‍රික්කයේ තොරතුරු

වයඹ පලාත තුල පිහිටා ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර 4812.7 කි.එනම් හෙක්ටයාර් 481270 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 කි. ග්‍රාම සේවා වසම් 1610 ක් අයත් වෙයි.දිස්ත්‍රික්කයේ මුළු ගම්මාන සංඛාව 4432 ක් වන අතර ජන්ද කොට්ඨාශ 14 කි. දිස්ත්‍රික්කයේ මහ නගර සභා 01 ක් හා නගර සභා 01 ක් ඇත. ප්‍රාදේශීය සභා 18 කි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 06 කි. පාසල් 875 කි. මෙයින් 28 ක් ජාතික පාසැල් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගුරුවරු ප්‍රමාණය 20,223 ක් වෙයි.

සාපේක්ෂ වශයෙන් ගත් කල කුරුණෑගල දිස්ත්‍රික්කය දිස්ත්‍රික්ක 5 කින් වට වී ඇත. එනම් උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයත්, නැගෙනහිරින් මාතලේ දිස්ත්‍රික්කයත්, දකුණින් ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්කත්, බස්නාහිරින් පුත්තලම දිස්ත්‍රික්කයත් වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම උතුරු ඛණ්ඩාංක 228-333 සහ නැගෙනහිර ඛණ්ඩාංක 104-178 ත් අතර වෙයි.

ඓතිහාසික පසුබිම ගැන කථා කරන විට කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අන් දිස්ත්‍රික්ක වලට වඩා වැඩි සුවිශේෂී තාවයක් ගනී. එනම් රාජධානි හතරක් පැවති ලංකාවේ එකම දිස්ත්‍රික්කය ලෙස අභිමානයක් කුරුණෑගලට හිමිව තිබීමයි. පඬුවස්නුවර, කුරුණෑගල, යාපහුව, දඹදෙණිය එම රාජධානින් වන අතර මෙම රාජධානි යුග වලදී කීර්තිමත් රජවරු රැසක්ම සිටි බවට සාක්ෂි ඕනෑ තරම් හමුවේ.

දිස්ත්‍රික්කයේ ජල වහනය සලකන විට එය ප්‍රධාන වශයෙන් ගංගා ද්‍රෝණි 04 ක් මගින් ආවර්ණය වී ඇත. එනම් උතුරු ප්‍රදේශයෙන් කළා ඔය දෝණියද,මධ්‍යම ප්‍රදේශයෙන් මී ඔය හා දැදුරු ඔය දෝණිද, දකුණු ප්‍රදේශයෙන් මා ඔය දෝණියද වශයෙනි. මෙම ජල වහන ද්‍රෝණි තුල රාජාංගනය, උස්ගල සියඹලන්ගමුව, හක්වටුනාඔය, කිඹුල්වානා ඔය, බතලගොඩ, මාගල්ල, පාලුකඩවල, අතරගල්ල, මැඩියාව, වෙන්නොරුව, අඹකොලවැව ඇතුළු මහා පරිමාණ හා සුළු පරිමාණ වාරිමාර්ග ක්‍රම රාශියක් ක්‍රියාත්මක වෙයි.

දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 900 – 2200 අතර වෙයි. ඊසාන දිග මෝසම් සුළං හා නිරිත දිග මෝසම් සුළං හා සංවහන ක්‍රියාකාරිත්වය නිසා ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන අතර වැඩිම ප්‍රමාණයක් ලැබෙනුයේ නිරිත දිග මෝසම් සුළං ප්‍රවාහය මගිනි.

## 1.9 දිස්ත්‍රික් සැලැස්ම

# කුරුණෑගල දිස්ත්‍රික්කය

| ප්‍රා.ලේ. කාර්යාලය | ග්‍රාම නිලධාරී වසම් ගණන |
|---|---|
| 1. ගිරිබාව | 35 |
| 2. ගල්ගමුව | 62 |
| 3. ඇහැටුවැව | 35 |
| 4. මහව | 68 |
| 5. අඹන්පොල | 28 |
| 6. කොටවෙහෙර | 31 |
| 7. රස්නායකපුර | 28 |
| 8. නිකවැරටිය | 42 |
| 9. පොල්පිතිගම | 82 |
| 10. ඉබ්බාගමුව | 74 |
| 11. ගනේවත්ත | 42 |
| 12. රිදීගම | 113 |
| 13. මාවතගම | 71 |
| 14. මල්ලවපිටිය | 45 |
| 15. කුරුණෑගල | 54 |
| 16. මාස්පොත | 33 |
| 17. වීරඹුගෙදර | 38 |
| 18. පොල්ගහවෙල | 84 |
| 19. අලව්ව | 66 |
| 20. නාරම්මල | 54 |
| 21. කුලියාපිටිය නැගෙනහිර | 45 |
| 22. කුලියාපිටිය බටහිර | 68 |
| 23. වාරියපොල | 56 |
| 24. පඩුවස්නුවර නැගෙනහිර | 36 |
| 25. බමුණාකොටුව | 36 |
| 26. කොබෙයිගනේ | 35 |
| 27. පඩුවස්නුවර බටහිර | 67 |
| 28. බිංගිරිය | 52 |
| 29. උඩුබද්දාව | 43 |
| 30. පන්නල | 87 |
| | **1610** |






## 1.10 කාර්ය මණ්ඩල සැකැස්ම

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන සටහන පහත දැක්වේ.



දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල ලැයිස්තුව පහත පරිදි වෙයි.

| වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | පවත්නා කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 9 | 3 |
| තෘතියක මට්ටම | 02 | 02 | 0 |
| ද්විතියක මට්ටම | 80 | 80 | 0 |
| ප්‍රාථමික මට්ටම | 22 | 17 | 5 |
| එකතුව | **116** | **108** | **8** |

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවා.

### 2.1 ආයතන අංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ආයතන කටයුතු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30ක දිස්ත්‍රික් මට්ටමේ ආයතන කටයුතු ඉටු කිරීම ආයතන අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි. දිස්ත්‍රික්කයේ සමස්ත පරිපාලනය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍යවන ආයතනික පසුබිම ක්‍රියාත්මක කරනු ලබන්නේ ආයතන අංශය මගිනි.
2014 වර්ෂය ආරම්භයේ විනය ගොනු 23ක් පැවති අතර, ඉන් ගොනු 4ක වැඩ අවසන් කිරීමට හැකි විය.වර්ෂය තුළ ගිනි අවි අයදුම්පත් 59ක් ලැබී තිබූ අතර, ඉන් සුදුසුකම් ලද අයදුම්පත් 26ක් නිර්දේශ කර, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි. මෙම වර්ෂය තුළ අළුත් කළ ගිනි අවි බලපත්‍ර සංඛ්‍යාව 2017 වන අතර මුරකරු අවසර පත්‍ර 50ක් නිකුත් කිරීම සිදු විය.

2014 වර්ෂය තුළ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහන අළුත් වැඩියාව සඳහා රුපියල් 1,933,574.53ක මුදලක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන අළුත් වැඩියාව සඳහා රුපියල් 7,978,515.41 ක මුදලක් වියදම් වී ඇත.

2014 වර්ෂයේ මූලික පරිඝණක පුහුණු පාඨමාලා 06 ක් පේරෝල් පුහුණු පාඨමාලා 02 ක් Internet - Email පුහුණු පාඨමාලා 02 ක් , Access Deta base - 02 ක් SLIDA පරිඝණක ධාවන බලපත්‍ර පාඨමාලා 02 ක්. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට සම්බන්ධ නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සඳහා වූවිවධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

### 2.2 ගිණුම් අංශය

ගිණුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි මූල්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීමයි.

### 2.3 දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශය

දිස්ත්‍රික්කය තුළ කෙරෙන ප්‍රධාන සංවර්ධන කටයුතුවල සම්බන්ධීකරණ ඒකකය දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයයි.

1) දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහනVI අදියර.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශා මගින් ක්‍රියාත්මක කරන ලද දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන VI අදියර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රතිලාභින් සඳහා පහත සඳහන් අකාරයෙන් යෙදවුම් ලබාදීම සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදි.

| වර්ගය | ප්‍රතිපාදන |
|---|---|
| පොල්පැල ලබාදීම සඳහා | රු 60,000,000.00 |
| එළවළු පැළ ලබාදීම සහ පළතුරු පැළ ලබාදීම | රු 19,591,946.00 |

ඒ අනුව 2014 වර්ෂයේ දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් වෙත පොල් පැළ, එළවළු පැළ සහ පළතුරු පැළ ලබාදීම වෙනුවෙන් දරණ ලද වියදම රු 30,472,780.00 කි. 2014.12.31 ලැබුණ අක්මුදල් ප්‍රමාණවත් නොවීම නිසා රු 36,427,630.00 ක බිල් අවිච්ඡේද විය.

2) ගමනැගුම-එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන.

2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදගෙන ගමනැගුම - එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පහත සඳහන් පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර 2014.12.31 දිනට සංරචක අනුව සාරාංශ වාර්තාව පහත පරිදි වේ.

| අනු අංකය | සංරචකය | ලබාදුන් ප්‍රතිපාදන | අනුමත ව්‍යාපෘති ගණන | **2014.12.31** දිනට නිමි ව්‍යාපෘති | මාසය අවසානයේ වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | විදුලිය | 1,534,500.00 | 4 | 4 | 827,813.15 | 23 |
| 2 | මාර්ග | 1,159,312,589.24 | 2013 | 1631 | 733,299,811 | 637342 |
| 3 | අධ්‍යාපනය | 20,252,272.73 | 28 | 23 | 10,611,205 | 6227 |
| 4 | සෞඛ්‍ය | 3,019,500.00 | 5 | 5 | 1,979,092 | 1390 |
| 5 | සමාජ සුභසාධනය | 191,081,261.23 | 271 | 215 | 124,573,140 | 112373 |
| 6 | වාරිමාර්ග | 158,104,836.49 | 282 | 232 | 106,243,757 | 61463 |
| 7 | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 43,765,461.60 | 76 | 65 | 31,524,778 | 20156 |
| 8 | වෙළඳ | 2,453,636.36 | 1 | 0 | - | 0 |
| 9 | කෘෂිකර්මය | 22,869,000.00 | 110 | 109 | 19,483,010 | 1316 |
| 10 | සත්ව පාලනය | 396,000.00 | 1 | 1 | 310,248 | 10 |
| 11 | ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය | - | 0 | 0 | - | 0 |
| 12 | ග්‍රාමීය හා සුළු පරිමාණ කර්මාන්ත | 7,210,942.35 | 20 | 1 | 98,980 | 6 |
| 13 | වන ජීවී හා වනරොද සංරක්ෂණය | - | 0 | 0 | - | 0 |
| | මුළු එකතුව | **1,610,000,000.00** | **2811** | **2286** | **1,028,951,834** | **840306** |

3) ගමනැගුම-විශේෂ සංවර්ධන වැඩසටහන.

2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදගෙන ගමනැගුම - විශේෂ සංවර්ධන වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පහත සඳහන් පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර 2014.12.31 දිනට සංරචක අනුව සාරාංශ වාර්තාව පහත පරිදි වේ.

| අනු අංකය | සංරචකය | ලබාදුන් ප්‍රතිපාදන | යෝජනා ගණන | 2014.12.31 දිනට නිමි ව්‍යාපෘති | මාසය අවසානයේ වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | විදුලිය | 2,811,600.00 | 10 | 10 | 2,085,126.50 | 1841 |
| 2 | මාර්ග | 282,613,958.00 | 556 | 361 | 90,408,276.29 | 201590 |
| 3 | අධ්‍යාපනය | 24,327,209.60 | 141 | 131 | 14,794,939.61 | 22619 |
| 4 | සෞඛ්‍ය | 9,431,149.40 | 14 | 11 | 4,714,253.34 | 7501 |
| 5 | සමාජ සුභසාධනය | 140,817,856.84 | 258 | 187 | 57,408,505.52 | 88760 |
| 6 | වාරිමාර්ග | 63,810,513.69 | 91 | 67 | 30,708,755.38 | 16092 |
| 7 | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 38,122,088.44 | 45 | 31 | 16,890,169.70 | 8737 |
| 8 | වෙළඳ | 3,528,309.85 | 2 | 0 | 3,461,744.98 | 0 |
| 9 | කෘෂිකර්මය | 6,669,828.00 | 7 | 6 | 2,934,463.16 | 261 |
| 10 | සත්ව පාලනය | 12,042,935.00 | 35 | 30 | 8,006,307.48 | 730 |
| 11 | ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය | 1,533,200.00 | 21 | 20 | 1,198,043.30 | 548 |
| 12 | ග්‍රාමීය හා සුළු පරිමාණ කර්මාන්ත | 14,882,273.25 | 32 | 23 | 8,584,473.59 | 966 |
| 13 | වන ජීවී හා වනරොද සංරක්ෂණය | - | 0 | 0 | - | 0 |
| | **මුළු එකතුව** | **600,590,922.07** | **1212** | **877** | **241,195,058.85** | **349645** |

4) "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ග්‍රාමීය පාසැල්වල සනීපාරක්ෂක පහසුකම් හා අනෙකුත් පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන.

රටේ අනාගත දරු පරපුර සඳහා කෙරෙන ආයෝජනයක් වශයෙන් ග්‍රාමීය පාසැල්වල සනීපාරක්ෂක පහසුකම් හා අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා රුපියල් මිලියන 84 ක පමණ මුදලක් වෙන්කරනලද අතර ග්‍රාමීය පාසැල්වල පහත සඳහන් අංශ සඳහා වැඩි අවධානයක් යොමුකරමින් සංවර්ධන කටයුතු සිදුකලේය.

01. විදුලිබල පහසුකම් හා ජල පහසුකම් සැපයීම
02. පාසැල් වැට හා ගේට්ටුව සකස් කිරීම
03. පවතින ගොඩනැගිලි අළුත්වැඩියාව/තීන්ත ආලේප කිරීම
04. පාසැලේ නාමපුවරු සකස්කිරීම

05. ගුරු නිවාස අළුත්වැඩියාව
06. පංති කාමර අළුත්වැඩියාව
07. උපකරණ මිලදී ගැනීම් හැර ඕනෑම ප්‍රාග්ධන වියදමක්

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ම ආවරණය වන පරිදි පාසැල් 390 ක ව්‍යාපෘති 390 ක් ක්‍රියාත්මක කල අතර මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 98% කි. එහි මූල්‍ය ප්‍රගතිය 83.7% පමණ වේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කළාප අධ්‍යාපන කාර්යාල හරහා සාර්ථකව ක්‍රියාත්මකවූ සංවර්ධන ව්‍යාපෘතියක් වන මෙම වැඩසටහන දැයේ දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් සිදුකල මහඟු ආයෝජනයකි.

මිස්සක ඉ - නැණසල " පාසැල් පරිගණක විද්‍යාගාර වැඩසටහන :-

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මකවූ සංවර්ධන ව්‍යාපෘතියක් වන මෙය දැයේ දූ දරුවන්ගේ පරිගණක සාක්ෂරතා ඥාණය/තොරතුරු තාක්ෂණ දැණුම වැඩිදියුණු කිරීමේ බලාපොරොත්තුවෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියකි.

දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ මට්ටමින් ලබාගත් තොරතුරු, නිර්ණායක පදනම් කරගෙන මේ සඳහා පාසැල් තෝරාගන්නා ලදී. තෝරාගත් පාසැල් ප්‍රමුඛතාගත කොට පළමු අදියර යටතේ පාසැල් 17 ක් සඳහා පරිගණක තාක්ෂණ පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව පරිගණක විද්‍යාගාරයට අවශ්‍ය ගොඩනැගිල්ලක් (පංති කාමරයක්) පාසැලේ පවතීනම් එය ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපාදන ලබාදුන් අතර ඒ සඳහා රුපියල් 9,190,834.98 ක් වෙන් කළේය. පංති කාමරය සකස් කිරීමෙන් අනතුරුව ඒ සඳහා අවශ්‍ය පරිගණක ඇතුළු උපකරණ ලබා දෙන ලදී.

01. පරිගණක 10
02. පරිගණක මේස 10
03. පරිගණක පුටු 20

ලෙස උපකරණ ලබාදී ඇත.

මෙම ව්‍යාපෘතිය 2014.12.31 දින වන විට 100% ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කළ අතර ඒ සඳහා රුපියල් 8,568,663.53 ක වියදමක් දරා ඇත. මෙය දරුවන්ගේ තොරතුරු තාක්ෂණ දැණුම හා පරිගණක සාක්ෂරතා ඥාණය වැඩිදියුණු කරනු වස් ක්‍රියාත්මක කළ සාර්ථක ව්‍යාපෘතියකි.

5) වනජීවී සංරක්ෂණ වැඩසටහන.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වියලි කලාපයේ ජීවත් වන බහුතරයක් ජනතාව කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජීවනෝපායන් වල නිරත වන අතර මෙම කලාපයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජීවත් වන ජනතාව මුහුණ දෙන පීඩාකාරී ගැටලුවක් ලෙස අලි මිනිස් ගැටුම දැක්විය හැකි අතර මෙම තර්ජනය නිසා අලි මෙන්ම මිනිස් ජීවිත රැසක්ම විනාශ වේ. එමෙන්ම කෘෂිකාර්මික වගා බිම් හානිද සිදුවේ. මෙම හේතුව නිසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා වන

සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා අදාල ප්‍රාදේශීය සංවිධානද සම්බන්ධ කරගනිමින් වනජීවී සංරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දුන් අතර ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා රුපියල් 145,000,000.00 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. එම ප්‍රතිපාදනයෙන් රුපියල් 141,103,685.87ක් වන අලි මිනිස් ගැටුම බහුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක් සඳහා පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට වෙන් කරන ලදී.

- නව විදුලි වැට ඉදි කිරීම.
- පවතින විදුලි වැට අලුත් වැඩියාව.
- විදුලි වැටට සමාන්තර මාර්ගය ඉදිකිරීම.
- විදුලි කුටි සඳහා.
- අලීන් පලවා හැරීම හා අල්ලා ඉවත් කිරීම.
- වැව් ප්‍රතිසංස්කරණය කිරීම

6) විමධ්‍යගත මූලධන අයවැය වැඩසටහන.

2014 වර්ෂයේදී විමධ්‍යගත මූලධන අයවැය වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදී. එයට අදාලව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල 2014.12.31 දිනට සංරචක අනුව සාරාංශ වාර්තාව පහත දැක්වේ.

| අනු අංකය | සංරචකය | ලබාදුන් ප්‍රතිපාදන (ප්‍රා.ලේ.ප.වි.සමග 1%) (රු) | ප්‍රතිපාදන අනුමත යෝජනා ගණන | වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | විදුලිය | 1,925,293.40 | 37 | 1,715,504.67 | 6,329 |
| 2 | මාර්ග | 3,070,292.62 | 45 | 2,546,324.35 | 21,964 |
| 3 | අධ්‍යාපනය | 5,491,192.18 | 103 | 6,612,746.76 | 50,810 |
| 4 | සෞඛ්‍ය | 230,024.19 | 5 | 216,385.71 | 6,555 |
| 5 | සමාජ සුභසාධනය | 65,041,842.31 | 1701 | 59,736,460.00 | 338,693 |
| 6 | වාරිමාර්ග | 10,001.05 | 1 | - | 100 |
| 7 | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 370,038.92 | 10 | 353,219.37 | 918 |
| 8 | වෙළඳ | - | 0 | - | - |
| 9 | කෘෂිකර්මය | 180,018.93 | 2 | 177,460.29 | 2,250 |
| 10 | සත්ව පාලනය | - | 0 | - | - |
| 11 | ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය | - | 0 | - | - |
| 12 | ග්‍රාමීය හා සුළු පරිමාණ කර්මාන්ත | 60,006.31 | 2 | 59,040.09 | 140 |
| 13 | වන ජීවී හා වනරොද සංරක්ෂණය | - | 0 | - | - |
| 14 | නාගරික සංවර්ධන | - | | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 15 | නිවාස | 151,531.09 | 4 | 150,783.03 | - |
| 16 | ජීවනෝපාය සංවර්ධන | 248,510.99 | 41 | 247,284.16 | - |
| | **මුළු එකතුව** | **76,778,752.00** | **1951** | **71,815,208.44** | **427,759** |

7) මහජන නියෝජිතයින්ගේ සංවර්ධන යෝජනා (මිලියන 25)

2014 වර්ෂයේදී මහජන නියෝජිතයන්ගේ සංවර්ධන වැඩසටහන (මිලියන 25) යටතේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදි. එයට අදාලව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල 2014.12.31 දිනට සංරචක අනුව සාරාංශ වාර්තාව පහත දැක්වේ.

| අනු අංකය | සංරචකය | ලබාදුන් ප්‍රතිපාදන (ප්‍රා.ලේ.ප.වි.සමග 1%) (රු.) | ප්‍රතිපාදන අනුමත යෝජනා ගණන | වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | විදුලිය | 3,004,570.85 | 36 | 2,150,271.73 | 3,176 |
| 2 | මාර්ග | 114,776,854.86 | 549 | 36,996,430.22 | 105,541 |
| 3 | අධ්‍යාපනය | 16,285,411.54 | 116 | 5,682,265.69 | 31,961 |
| 4 | සෞඛ්‍ය | 650,415.82 | 6 | 40,071.56 | 1,650 |
| 5 | සමාජ සුභසාධනය | 51,318,808.97 | 450 | 24,953,525.69 | 63,363 |
| 6 | වාරිමාර්ග | 25,171,092.30 | 69 | 13,982,160.39 | 7,417 |
| 7 | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 8,509,745.42 | 45 | 4,273,219.16 | 3,672 |
| 8 | වෙළඳ | - | 0 | - | - |
| 9 | කෘෂිකර්මය | 2,696,724.06 | 18 | 954,015.49 | 1,065 |
| 10 | සත්ව පාලනය | 200,127.95 | 3 | 101,026.06 | 29 |
| 11 | ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය | 800,511.78 | 1 | 798,471.28 | 160 |
| 12 | ග්‍රාමීය හා සුළු පරිමාණ කර්මාන්ත | 30,214,204.45 | 51 | 15,158,720.67 | 4,400 |
| 13 | වන ජීවී හා වනරොද සංරක්ෂණය | - | 0 | - | - |
| 14 | නාගරික සංවර්ධන | 5,002,187.88 | 1 | - | - |
| | **මුළු එකතුව** | **258,630,655.88** | **1345** | **105,090,177.95** | **222,434** |

8) පළාත් නැගුම වැඩසටහන.

2014 වර්ෂයේ පළාත් නැගුම වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 2620 ක් ක්‍රියාත්මක කරන ලදී. එයට අදාලව සංවර්ධන යෝජනාවල 2014.12.31 දිනට සංරචක අනුව සාරාංශ වාර්තාව පහත දැක්වේ.

| අනු අංකය | සංරචකය | යෝජනා ගණන | ලබාදුන් ප්‍රතිපාදන(ප්‍රා.ලේ.ප.වි.සම ග 1%) | මාසය අවසානයේ වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **1** | විදුලිය | 4 | 5,222,750.00 | 5,222,210.00 | 24 |
| **2** | මාර්ග | 1761 | 863,768,439.16 | 361,437,314.89 | 452400 |
| **3** | අධ්‍යාපනය | 74 | 38,138,759.98 | 18,160,275.31 | 27151 |
| **4** | සෞඛ්‍ය | 14 | 23,892,066.04 | 11,548,688.60 | 8601 |
| **5** | සමාජ සුභසාධනය | 367 | 359,801,830.72 | 109,946,723.40 | 253798 |
| **6** | වාරිමාර්ග | 250 | 156,761,302.11 | 117,599,754.63 | 49839 |
| **7** | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 116 | 100,763,528.56 | 50,922,161.80 | 21683 |
| **8** | වෙළඳ | 2 | 1,485,000.00 | 103,000.00 | 3808 |
| **9** | කෘෂිකර්මය | 4 | 319,108.68 | 152,811.09 | 254 |
| **10** | සත්ව පාලනය | 4 | 423,000.00 | 197,750.00 | 27 |
| **11** | ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය | 10 | 1,541,430.00 | 1,326,674.55 | 3535 |
| **12** | ග්‍රාමීය හා සුළු පරිමාණ කර්මාන්ත | 14 | 30,699,288.36 | 27,876,697.66 | 685 |
| | පරිපාලන වියදම | | 20,436,539.65 | 16,771,306.19 | |
| | **මුළු එකතුව** | **2620** | **1,603,253,043.26** | **721,265,368.12** | **821805** |

9) ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන. (මිලියන 10)

2014 වර්ෂයේදි ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන (මිලියන 10) යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ එක් ගමකට එක් වැඩසටහන සහ ගමනැගුම විශේෂ වැඩසටහන සඳහා වෙන්කල ප්‍රතිපාදන භාවිතා කර ක්‍රියාත්මක කරන ලෙසට දන්වා තිබුණු බැවින් වෙනම ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුනොවුනි. එයට අදාලව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල 2014.12.31 දිනට සංරචක අනුව සාරාංශ වාර්තාව පහත දැක්වේ.

| අනු අංකය | සංරචකය | වෙන්කල මුදල රු. | යෝජනා ගණන | මාසය අවසානයේ වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | විදුලිය | 72,885.00 | 4 | 53,320.00 | 235 |
| 2 | මාර්ග | 79,583,464.88 | 303 | 9,857,615.17 | 40538 |
| 3 | අධ්‍යාපනය | 22,585,686.12 | 120 | 6,206,773.05 | 41420 |
| 4 | සෞඛ්‍ය | 703,082.41 | 4 | 49,000.00 | 525 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | සමාජ සුභසාධනය | 22,587,028.45 | 239 | 9,687,804.32 | 24646 |
| 6 | වාරිමාර්ග | 4,768,406.19 | 27 | 1,002,550.12 | 219 |
| 7 | ජල සම්පාදනය හා සනීපාරක්ෂාව | 3,258,493.64 | 21 | 1,397,469.00 | 2403 |
| 8 | වෙළඳ | 1,082,709.90 | 4 | 1,082,709.90 | - |
| 9 | කෘෂිකර්මය | 284,719.00 | 7 | 281,900.00 | - |
| 10 | සත්ව පාලනය | 1,297,379.00 | 6 | 773,880.00 | 18 |
| 11 | ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය | 945,672.00 | 5 | 945,672.00 | 121 |
| 12 | ග්‍රාමීය හා සුළු පරිමාණ කර්මාන්ත | 5,840,711.61 | 92 | 3,180,077.26 | 1601 |
| 13 | වන ජීවී හා වනරොද සංරක්ෂණය | - | - | - | - |
| 14 | නාගරික සංවර්ධනය | - | - | - | - |
| | මුළු එකතුව | **143,010,238.20** | **832** | **34,518,770.82** | **111,726** |

10) "ඉසුරුමත් මව්බිමක් අසිරිමත් නිවහනක්" නිවාස සංවර්ධන වැඩසටහන.

දැයට කිරුළ 2014 ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව "ඉසුරුමත් මව්බිමක් අසිරිමත් නිවහනක්" තේමාව යටතේ මෙම නිවාස සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් ප්‍රතිලාභී පවුල් 2535ක් සඳහා අදියර තුනක් යටතේ රු.100,051,918.00 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර, එයට අදාලව 2014.12.31 දිනට සාරාංශ වාර්තාව පහත දැක්වේ.

| අදියර | ප්‍රතිලාභී පවුල් | ලබාදුන් ප්‍රතිපාදන (රු.) | **2014.12.31** දිනට වියදම (රු.) | **2014.12.31** දිනට අතැති බිල්පත් (රු.) | **2014.12.31** දිනට අවිච්ඡේද වැඩ (රු.) |
|---|---|---|---|---|---|
| 1 අදියර | 1776 | 59,745,918.00 | 15,156,774.00 | - | 38,503,858.00 |
| 11 අදියර | 280 | 9,171,000.00 | 9,552,190.00 | 420,000.00 | 1,618,154.00 |
| 111 අදියර | 479 | 31,135,000.00 | 11,300,196.86 | 4,698,214.14 | 13,461,428.00 |
| මුළු එකතුව | **2535** | **100,051,918.00** | **36,009,160.86** | **5,118,214.14** | **53,583,440.00** |

11) දැයට කිරුළ වැඩසටහන.

2014.12.31 දින තෙක් දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව සිදුකළ සංවර්ධන ව්‍යාපෘති.

| ව්‍යාපෘති නාමය | ඇස්තමේන්තුගත මුදල (රු.) | 2014.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| නව මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන | 543,576,139.30 | 193,391,647.15 |
| සතිපොල ඉදිකිරිම | 1,217,044,048.67 | 376,771,249.18 |
| බස්නැවතුම්පල ඉදිකිරීම | 282,970,082.19 | 73,781,181.75 |
| ආදාහනාගාර ඉදිකිරීම | 113,782,238.89 | 35,325,065.68 |
| රථගාල් ඉදිකිරීම | 56,516,672.62 | 11,911,544.30 |
| නගර ශාලා | 123,346,997.33 | 30,898,091.90 |
| පානීය ජල ව්‍යාපෘති | 6,793,260.12 | - |
| සුළු වාරිමාර්ග ව්‍යාපෘති | 13,701,373.18 | 6,614,009.23 |
| මාතෘ සායන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම | 9,410,717.23 | 6,616,309.38 |
| **මුළු එකතුව** | **2,367,141,529.51** | **735,309,098.56** |

12) පළාත් මාර්ග සංවර්ධන වැඩසටහන.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත 2011 වර්ෂයේ සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාර්ග 67 ක් මාර්ග කාපට් කිරීම සිදු කරන ලද අතර මැතිවරණ කොට්ඨාශ මට්ටමින් 2014.12.31 දිනට ප්‍රගතිය පහත පරිදිවේ.

| මැතිවරණ කොට්ඨාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | සංවර්ධනය කරන දුර කි.මී. | සමස්ත ප්‍රගතිය | 2014 වියදම රු. | මුළු වියදම රු. |
|---|---|---|---|---|---|
| කුරුණෑගල | 5 | 37.78 | 100% | 46,657,930.65 | 532,052,686.98 |
| පොල්ගහවෙල | 1 | 2.2 | 100% | 2,363,560.08 | 24,287,334.82 |
| මාවතගම | 6 | 24.05 | 100% | 6,514,662.92 | 398,145,749.58 |
| දොඩම්ගස්ලන්ද | 7 | 41.3 | 100% | 116,081,581.66 | 498,681,616.83 |
| හිරියාල | 4 | 27.59 | 100% | 48,522,408.89 | 409,526,832.98 |
| දඹදෙණිය | 11 | 48.283 | 100% | 106,002,603.23 | 653,064,330.38 |
| බිංගිරිය | 2 | 26.07 | 100% | 4,072,172.32 | 358,010,328.54 |
| කටුගම්පොල | 5 | 41.4 | 100% | 8,491,495.53 | 568,296,161.85 |
| කුලියාපිටිය | 6 | 32.18 | 100% | 4,736,187.92 | 422,319,282.60 |
| පඩුවස්නුවර | 4 | 36.24 | 100% | 1,122,256.93 | 530,990,601.94 |
| නිකවැරටිය | 3 | 24.6 | 100% | 6,664,876.11 | 359,154,495.05 |
| වාරියපොල | 8 | 33.55 | 100% | 86,189,671.14 | 520,377,049.26 |
| යාපහුව | 3 | 25.42 | 100% | 15,109,279.73 | 351,080,420.74 |
| ගල්ගමුව | 2 | 27.8 | 100% | 20,718,688.90 | 496,862,942.17 |
| එකතුව | 67 | 428.463 | 100% | 473,247,376.01 | 6,122,849,833.72 |
| තාර සඳහා දරන වියදම රු. | | | | | 563,008,320.00 |
| **ශුද්ධ වියදම රු.** | | | | **946,494,752.02** | **559,841,513.72** |

## 2.4 පුපුරණ ද්‍රව්‍ය අංශය.

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පත්කරනු ලැබූ සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ දිස්ත්‍රික්කය තුල ව්‍යාපාරික/ව්‍යාපාරික නොවන කළු ගල් කැඩීම සඳහා බලපත්‍ර ලබාදීම, රතිඤ්ඤා විකිණීමට/සෑදීමට බලපත්‍ර නිකුත් කිරීම, ගිණි අවි සඳහා පතොරම් නිකුත් කිරීම, කෘෂිකාර්මික/ආත්මාරක්ෂක ගිණි අවි සඳහා පතරොම් නිකුත් කිරීම, වෙඩි බෙහෙත් ගබඩා/වෙළඳ නියෝජිත අධීක්ෂණයයි. 2014 වර්ෂයේදී අවසර පත්‍ර 510 ක්ද රතිඤ්ඤා සඳහා බලපත්‍ර 63 ක්ද නිකුත් කරන ලදි. පතොරම් ලබා ගැනීම සඳහා නිකුත්කල ලිපි සංඛ්‍යාව 1406 කි.

## 2.5 ප්‍රවෘත්ති අංශය

කුරුණෑගල දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයෙන් දිස්ත්‍රික්කයේ ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික වැනි සියළු සංවර්ධනාත්මක තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙත යොමු කිරීම හා දිස්ත්‍රික්කයේ විවිධ ආයතනවලින් මාධ්‍ය ආවරණයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින විට අදාල ස්ථාන වලට මාධ්‍ය වේදීන් යොමු කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව 2014 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයෙන් කරනු ලැබූ කාර්යභාරයේ සාරාංශයක් පහත පරිදි වේ.

- දිස්ත්‍රික්කයේ සංවර්ධනයට අදාල ප්‍රවෘත්ති නිවේදන 66 ක් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට සහ ජනමාධ්‍යන්ට නිකුත් කිරීම.

- සංවර්ධනයට අදාල විවිධ උත්සව කටයුතු සඳහා මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු 24 ක් සිදුකර ඇත.

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා එක්ව දැයට කිරුලට සමගාමීව ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුලුවක් පැවැත්වීම. 2014/01/18 දින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මහතාගේ ප්‍රධානත්වයෙන් කුලියාපිටිය හැපි ලියෝනි හෝටලය.සහභාගි වූ සංඛ්‍යාව 82.





- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමග එක්ව දිස්ත්‍රික් සංවර්ධනය පිළිබඳව ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩමුලුවක් පැවැත්වීම.2014.02.17 දින රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ආරියරත්න ඇතුගල මහතාගේ ප්‍රධානත්වයෙන් කරුණෑගල බ්ලූස්කයි හෝටලයේ දී - සහභාගි වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව 106.






- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා එක්ව නව මාධ්‍ය භාවිතය පිළිබඳ පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩමුලුවක් පැවැත්වීම. 2014.03.18 දින වයඹ රාජකීය විද්‍යාලයේ දි පැවති මෙම වැඩමුලුවට කරුණෑගල දිස්ත්‍රික්කයේ පාසැල් 45ක ළමයින් 550 ක් සහභාගී වුහ.





## 2.6 <u>දිස්ත්‍රික් දිවිනැගුම අංශය.</u>

ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා දිවිනැගුම දෙපර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වැඩසටහන් වල දිස්ත්‍රික් මට්ටමේ සම්බන්ධිකරණය මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මෙම කාර්යයන් සඳහා දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට අමතරව සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලද වෙනම අංශයන් ස්ථාපිත කර ඇති අතර කලාප මට්ටමින් දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම් 120 ද දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති 30 ක්ද පිහිටුවා ඇත.

2014 වර්ෂයේ ක්‍රියාත්මක කල ප්‍රධාන වැඩ සටහන් පහත පරිදි වේ.

1) සමෘද්ධි සුභසාධන වැඩ සටහන.

අඩු ආදායම් ලාභී පවුල් වල දුගීබව අවම කිරීම අරමුණුකර 2014 වර්ෂය තුල දිවිනැගුම දෙපාර්තමේන්තුව යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

I. සමෘද්ධි සහනාධාර වැඩ සටහන

අඩු ආදායම්ලාභී පවුල් සඳහා අවම යැපුම් මට්ටමක් හෝ පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා මෙය ක්‍රියාත්මකයි . 2014 වර්ෂයේදී සහනාධාරලාභීන් 149636සඳහා සහනාධාර නිකුත් කරන ලදී. ඒ සඳහා රු.මි. 1090.19ක් පමණ වැය කරන ලදී.

II. පෝෂණ වැඩසටහන

අඩු ආදායම්ලාභී ගැබිණි හා කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ තත්වය වර්ධනය කිරීම සඳහා මහින්ද චින්තන වැඩ සටහන යටතේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපර්තමේනතුව මගින් මෙම වැඩ සටහන 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කෙරිනි.

රු.500 ක් වටිනාකමින් යුක්ත මෙම පෝෂණ පත්‍රිකාව මාස 20 ක් වලංගු වන මුද්දර 20 කි. ඉන් මුද්දර 8 ක් පූර්ව මාතෘ අවධිය සඳහා ද ඉතිරි මුද්දර 12 කිරිදෙන මව සඳහා ද වෙන්කර ඇත. මෙහිදි දිස්ත්‍රික්කයේ දෙසැම්බර් මස උපරිමය 4088 කි. 2014 සඳහා වියදම රු.මි.24.52 කි.

2) සමාජ ආරක්ෂණ වැඩ සටහන.

සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපර්තමේන්තුව මගින් සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ සහන සඳහා ඔවුන්ගේ යැපෙන්නන්ගේ විවිධ ආපදා අවස්ථාවලදී මූල්‍යමය සහනයක් ලබා දීමේ පරමාර්ථය ඇතිව සමාජ ආරක්ෂන අරමුදල පිහිටුවා අත. සෑම සමෘද්ධි ප්‍රතිලාභියකුගෙන්ම මසකට රු 45 /= බැගින් සමාජ ආරක්ෂණ අරමුදලට බැර කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා කටයුතු කරනු ලබයි.

දරු උපතක් සඳහා රු.5000/= මරණයක් සඳහා රු.10000 /=ක්ද රෝහල් ගත වීමක් සඳහා දිනකට රු.200/= ක් ද බැගින් දින 30 ක උපරිමයකට යටත්ව විවාහයක් සඳහා රු 3000 ක් ද මෙම අරමුදල මගින් ලබා දෙනු ලැබේ. මේ අනුව 2014 වර්ෂය සඳහා ඉහත ගෙවීම් කටයුතු වෙනුවෙන් සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපර්තමේන්තුව මගින් රු.මි 61.71 ක මුදලක් ලබා දෙන ලදී. ඒ පහත අන්දමට වේ.

- උපත් 1180 ක්සඳහා .රු.මි.5.9 ක මුදලක්ද
- විවාහ සඳහා2645 ක්සඳහා රු.මි.13.22 ක මුදලක්ද
- රොහල්ගත වීම් සඳහා3594 ක්සඳහා රු.මි.10.81 ක මුදලක්ද
- මරණ සඳහා3178 ක්සඳහා රු.31.78 ක මුදලක් ද

3) සමෘද්ධි ජීවනෝපාය සංවර්ධන වැඩසටහන.(චක්‍රීය අරමුදල)

දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව සෑම ගෘහ ඒකකයක්ම සොදුරු නිවහනක් බවට පත් කිරීමේ අරමුණින් ස්වයං රැකියා ආරම්භ කිරීමට අපේක්ෂා කරන හා දැනට කුඩා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කර ඇති ව්‍යවසායකයින් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීම සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම්හි චක්‍රිය අරමුදල මගින් මූල්‍යාධාර ලබාදීම සිදු කෙරින.

| ව්‍යාපෘතිය | සංඛ්‍යාව | රජයේ දායකත්වය (රු.මි) |
|---|---|---|
| 1.කෘෂි | 232 | 9.11 |
| 2.සත්වපාලන | 157 | 6.79 |
| 3.කර්මාන්ත | 476 | 19.92 |
| 4.අලෙවි | 349 | 14.73 |

ඉහත ව්‍යාපෘති වඩාත් සාර්ථක කර ගැනීම වෙනුවෙන් අදාල ප්‍රතිලාභින්ට තාක්ෂණ පුහුණුව ලබා දී ඇති අතර අවශ්‍ය උපකරණ කට්ටලද බෙදා දෙන ලදී.

4) දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (සෘජු ප්‍රතිපාදන).

දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව සෑම ගෘහ ඒකකයක්ම සොඳුරු නිවහනක් බවට පත් කිරීමේ අරමුණින් ස්වයං රැකියා ආරම්භ කිරීමට අපේක්ෂා කරන හා දැනට කුඩා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කර ඇති ව්‍යවසායකයින් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති 5466 ක් වැඩි දියුණු කර ගැනීම සඳහා සෘජු ප්‍රතිපාදන ලෙස රු.මි. 135.45 ක මූල්‍යාධාර ලබාදීම සිදු කෙරින.

| ව්‍යාපෘතිය | සංඛ්‍යාව | රජයේ දායකත්වය (රු.මි) |
|---|---|---|
| 1.කෘෂි | 1546 | 26.118 |
| 2.සත්වපාලන /ධීවර | 1469 | 43.29 |
| 3.කර්මාන්ත | 2461 | 66.043 |

ඉහත ව්‍යාපෘතිද වඩාත් සාර්ථක කර ගැනීම වෙනුවෙන් අදාල ප්‍රතිලාභින්ට තාක්ෂණ පුහුණුව ලබා දී ඇති අතර අවශ්‍ය උපකරණ කට්ටලද බෙදා දෙන ලදී.

5) සමාජ සංවර්ධන වැඩ සටහන.

ආර්ථික සංවර්ධනයට සමගාමීව ආධ්‍යාත්මික සංවර්ධනයද සමාජ කණ්ඩායම් තුල වර්ධනය කිරීම මගින් යහපත් සමාජ පරිසරයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ.

I. මතට තිත වැඩ සටහන.

ජූනි මස 26දිනට යෙදුන ජාත්‍යන්තර මත් නිවාරණ දිනය පදනම් කරගෙන දැනුවත් කිරීම්, විරෝධතා පා ගමන් , වීදි නාට්‍ය පවත්වා මත් භාවිතයෙහි ආදීනව ප්‍රජාව වෙත පෙන්වා දීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කරන ලදී.

ජාත්‍යන්තර දුම්වැටි විරොධි කොඩි දිනය පදනම් කරගෙන දිවිනැගුම දෙපර්තමේන්තුව මගින් දිවයින පුරා වැඩසටහන් සතියක් පුරා ක්‍රියාත්මක කල අතර මුළු දිවයිනෙන්ම සිව්වන ස්ථානයට වැඩිම මුදල් එකතු කල අතර දිස්ත්‍රික්කය තුල එකතු කරන ලද මුළු මුදල රු මිලි 10.42 කි

II. දැයට කිරුළට සමගාමීව නිවාස සංවර්ධන වැඩසටහන 2013/2014.

මෙම වැඩ සටහන අඩු ආදායම් ලාභින් සඳහා සමෘද්ධි අධිකාරිය හා පසුව දිවිනැගුම දෙපර්තමේන්තුව 2013 හා 2014 වර්ෂ සඳහා නිවාස 3080 වෙනුවෙන් සෙවිළි කිරීම සඳහා උළු ලබා දීම වෙනුවෙන් (1 අදියර) රු. මිලි 83.4 ක මුදලක් වැය කර ඇත. තවද වහලය ගසා සෙවිළි කිරීම සඳහා උළු ලබා දීම වෙනුවෙන් (11 අදියර) රු. 39.49 ක් වැය කර ඇත.

III. රටවිරු නිවාස වැඩසටහන 2014.

දිවිනැගුම දෙපර්තමේන්තුව හා විදේශ සේවා නියුක්ත කාර්යාංශය ඒකාබද්ධව සමෘද්ධි බැංකු දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම් හරහා ක්‍රියාත්මක කෙරේ.විගමණික සේවකයින් සඳහා ක්‍රියාත්මකයි. නිවාසය සාදා ගැනිම සඳහා උපරිමය රු 300,000 ක් 10% ක වාර්ෂික පොළියක් යටතේ වසර 5 කින් ගෙවීම සඳහා ඉඩ ලබා දෙයි. 2014 වර්ෂය සඳහා ණය 1640 ක් නිකුත් කර ඇත. මුදාහල මුදල රු මි.471.55 කි.

6) දිවිනැගුම ප්‍රජා මූල බැංකු සංගම් වැඩ සටහන.

මෙම වැඩ සටහන තුල ඉතිරි කිරිමේ ප්‍රධාන සාධකය වූයේ ප්‍රජා මූල බැංකු සංගම් වැඩ සටහනය. බැංකු සංගම් තුලින් ප්‍රතිලාභින් ගේ මෙන්ම අඩු ආදායම්ලාභින්ගේ ආදායම් තත්වය වර්ධනය කිරීම සඳහා අඩු පොලි පදනම මත ණය ලබා දීම සිදුකෙරිනි. ස්වයං රැකියා ණය/පාරිභෝගික ණය/වගා ණය/නිවාස ණය/කිරුල ණය/රට විරු ණය ආදී ලෙස 2014 වර්ෂය සඳහා මුළු ණය සංඛ්‍යාව 111393 කි. මුදල රු .මිලි 3,169.692 කි. විවිධ රාජ්‍ය බැංකු වල කරන ලද මුලු ආයෝජන රු.මි.6,279.33 කි.

7) ප්‍රගති පාලනය.

දිවිනැගුම දෙපර්තමේන්තුවට අදාලව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සියළුම වැඩ සටහන් ක්‍රියාත්මකව ඇති ආකාරය විමසා බැලීම ඉලක්ක වලට අනුව ලබා ගත් ප්‍රතිඵලයන් සසදා බැලීම මේ යටතේ සිදුකෙරේ.මෙහිදි අදාල ඉලක්ක වලට අනුව ලබා ගත් ප්‍රතිඵලයන් සංඛ්‍යාත්මකව , ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව හා කාල පරාසයන්ට අනුව ඇගයීමක් කර ඇත.

ඉහත කරුණු වලට අදාලව මාසිකව, ත්‍රෛයිමාසිකව, අර්ධ වාර්ෂිකව, වාර්ෂිකව ඇගයීමක් එක් එක් විෂයන්ට අදාලව වෙන් වෙන්ව ඇගයීමක් කර ඇත.

8) වැටුප් හා ආයතන කටයුතු.

දිවිනැගුම දෙපර්තමේන්තුව යටතේ දිස්ත්‍රික්කයට අනුයුක්තව සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ගේ වැටුප් හා ආයතන කටයුතු ඉටු කරනු ලබන්නේ මෙම කාර්යාලය මගිනි.

මෙම දිස්ත්‍රික්කය තුල දිවිනැගුම දෙපර්තමේන්තුව මගින් ලබාදෙනු ලබන ප්‍රතිපාදන අක්මුදල් මෙම දිස්ත්‍රික්කයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල අතර බෙදාදීම දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ කටයුතු සඳහා යොදා ගැනිමත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අවශ්‍ය ස්ථාවර භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ මිලදි ගැනීමත් ගිණුම් අංශයෙන් සිදු කෙරේ. ගිණුම් කටයුතු සම්බන්ධව මාසික වාර්ථා ප්‍රගති පාලන කටයුතු කිරීම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු මෙහෙය වීම මෙම අංශයෙන් සිදුකෙරේ.

## 2.7 <u>සමාජ ආරක්ෂණ අංශය.</u>

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මුදල් අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් ස්වයං රැකියා හා අවිධිමත් අංශයේ රැකියාලාභීන් සඳහාත්, විවිධ ක්ෂේත්‍රයන් වල නියැළි වෘත්තිකයින් සඳහාත්, ක්‍රියාත්මක කරනු ලබන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම් තුමාගේ අධීක්ෂණය හා ප්‍රාදේශීය ලේකම්වරුන් ගේ මැදිහත් වීම යටතේ ග්‍රාමනිලධාරීන් හරහා දායකයින් බඳවාගනු ලබන්නකි.

2014 වර්ෂයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දායකයින් සඳහා 2367 ක ප්‍රමාණයක් බඳවාගෙන ඇති අතර, වාරික මුදල් වශයෙන් රු. 26,603,614.86 මුදලක් පහත සඳහන් පරිදි එක්රැස් කර ඇත.

| | | |
|---|---|---|
| නව බඳවාගැනීම් මඟින් - | රු. | 1,041,306.00 |
| තැපැල් කාර්යාල මඟින් - | රු. | 17,412,752.78 |
| දිස්ත්‍රික් කාර්යාලය මඟින් - | රු. | 994,551.00 |
| ප්‍රා.ලේ. කාර්යාල මඟින් - | රු. | 6,049,883.00 |
| බැංකු මඟින් - | රු. | 1,105,122.08 |

මේ වන විට (2014.12.31) විශ්‍රාම වැටුප්ලාභීන් 2944 ක් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කර ඇති අතර, 2014 වර්ෂයේදී විශ්‍රාම වැටුප්ලාභීන් 694 ක් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කර ඇත. ඒ සඳහා රු. 639,182.00 ක මුදලක් ගෙවා ඇත.

## 2.8 මිණුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය

මහජනතාව විසින් ඉදිරිපත් කරන පැමිණිලි පරීක්ෂා කර මිණුම් උපකරණ වල නිවැරදිතාව තහවුරු කිරීම තුලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම දිස්ත්‍රික් ලේකම්ට පැවරුණු තවත් වගකීමකි.

මෙම අංශයේ 2014 වසරේ කාර්යය සාධනය පහත පරිදි සාරාංශ කල හැකිවේ.

| | |
|---|---|
| මුද්‍රා තැබීමෙන් ලද ආදයම :- | රු 11,989,152.32 |
| මුද්‍රා තබන ලද ඒකක සංඛ්‍යාව :- | 84293 |
| සාර්ථක වැටලීම් සංඛ්‍යාව :- | 69 |
| තැත් කල වැටලීම් සංඛ්‍යාව :- | 1077 |
| අයකර ඇති දඩ මුදල් :- | රු 152,500.00 |
| දැනුවත් කරන ලද වෙළඳුන් සංඛ්‍යාව :- | 2125 |

## 2.9 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

පුද්ගලයෙකුගේ දක්ෂතාවය, කුසලතාවය හා හැකියාවට ගැලපෙන වෘත්තීය කෙෂ්ත්‍රයට යාමට අවශ්‍ය මඟ පෙන්වීමත්, එම කේෂ්ත්‍රයේ දියුණුව ලබා ගැනීමට මඟ පෙන්වීමත් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල වෘත්තීය මාර්ගෝපදේශ අංශයක් ස්ථාපිත කර ඇත.

මෙම අංශය මගින් සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන් දැනුවත් කිරීම, රැකියා සමාජ, ගුරුවරුන් දැනුවත් කිරීම, රැකියා පොළ, පුද්ගලික අංශයේ රැකියාගත කිරීමේ, වෘත්තීය අභියෝග ජය ගැනීමේ, ස්වයං රැකියා පෙළඹවීමේ, ව්‍යසායකත්ව සංවර්ධන, බාහිර උපාධි,නිදහස් රැකියා පෙළඹවීමේ ආදී වැඩසටහන් 2014 වර්ෂය තුල පවත්වා ඇති අතර ඒ සඳහා වියදම් කල මුදල රු.781,946.00 කි.

## 2.10 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අංශයකි. මෙම අංශය විසින් රැකියා විරහිත පුද්ගලයින් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීම, පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සංවර්ධනය කිරීම හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම පිණිස විවිධ ව්‍යාපාර කළමනාකරණ හා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙයට අමතරව ව්‍යවසායකයන් නගා සිටුවීම පිණිස මූල්‍ය, අලෙවි, තාක්ෂණික, පහසුකම් සැපයීම පිණිස විවිධ ආයතනික සම්බන්ධීකරණ කටයුතු ද කරනු ලැබේ. .

මෙම අංශය මගින් 2014 වර්ෂය තුල දැනුවත් කිරීමේ,ව්‍යාපර ගැන්වීමේ පුහුණු,අලෙවි කලමණාකරණ පුහුණු,ගිණුම්කරණ පුහුණු,වැනි පුහුණ වැඩ සටහන් ද,අලෙවි පොල සහ ප්‍රදර්ශන,පසු විපරම් රුස්වීම්,ව්‍යාපෘති පරීක්ෂණ වැනි වැඩ සටහන්ද ඉලක්කගතව සිදුකර ඇත.මේ සදහා ප්‍රතිලාභීන් 5948 ක ප්‍රමාණයක් සහභාගිත්වය දරා ඇති අතර රුපියල් 1,910,013.53 ක මුදලක් වියදම් වශයෙන් දරා ඇත.

## 2.11 සංඛ්‍යාලේඛණ අංශය

2014 වර්ෂය තුළ ඉටු කරන ලද සමීක්ෂණ / සංගණන පිළිබඳ වාර්තා පහත පරිදි වේ.

| අනු අංකය | කාර්යය | සම්පූර්ණ කළ යුතු දිනය | අදාළ දිනට ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | කෘෂිකර්ම සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම - වී වගාව | | |
| | 2013/2014 මහ කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණය | ජනවාරි 15 | 100% |
| | 2013/2014 මහ කන්නයේ වගා හානි වූ බිම් ප්‍රමාණය | අප්‍රේල් 15 | 100% |
| | 2014 යල කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණය | ජුලි 15 | 100% |
| | 2014 යල කන්නයේ වගා හානි වූ බිම් ප්‍රමාණය | ඔක්තෝබර් 15 | 100% |
| 02 | වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ වැඩසටහන | | |
| | 1. 2013/2014 මහ කන්නය | මාර්තු 30 දක්වා | 100% |
| | 2. 2014 යල කන්නය | අගෝස්තු 30 දක්වා | 58% |
| 03 | ගොඩ ගොවිතැන් වාර්තාව | | |
| | 1. 2013/2014 මහ කන්නය | ජූනි 01 | 100% |
| | 2. 2014 යල කන්නය | ඔක්තෝබර් 15 | 100% |
| 04 | සත්ත්ව පාලන සංඛ්‍යා ලේඛන 2014 | අගෝස්තු 30 | 100% |
| 05 | කෘෂිකර්ම සංගණනයට අදාළ ව ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු | අගෝස්තු 30 | 100% |
| 06 | මස් පිණිස සතුන් මැරීමේ වාර්තාව | මාර්තු 15 | 100% |
| 07 | ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය | සෑම මසකම තෙවන සතිය | 100% |
| 08 | දේශීය නිෂ්පාදන මිල හා නාගරික සිල්ලර මිල | | |
| | 1. සතිපතා මිල | සතියකට වරක් | 100% |
| | 2. අර්ධ මාසිකව කාණ්ඩ i | 1 වන හා 3 වන සතිය | 100% |
| | 3. මාසිකව කාණ්ඩ ii | මසකට වරක් | 100% |
| | 4. කාර්තු අනුව කාණ්ඩ iii | මාස 3කට වරක් | 100% |
| 09 | ත්‍රෛමාසික කර්මාන්ත සමීක්ෂණය - 2014 | මාස 3කට වරක් 4 වන මස 20 දිනට පෙර | 100% |
| 10 | පළාත් පාලන සංඛ්‍යා ලේඛන - 2014 | මාර්තු 30 | 100% |
| 11 | කර්මාන්ත සංගණනය 2014 ක්ෂේත්‍ර කටයුතු | දෙසැම්බර් 20 | 100% |

මෙම කාර්යන් වෙනුවෙන් දරන ලද වියදම රුපියල් 10,979,527.57 කි.

## 2.12 ජාතික පොහොර ලේකම් කාර්යාලය

මෙම අංශයේ 2014 වසරේ කාර්යය සාධනය පහත පරිදි සාරාංශ කල හැකිවේ.

1) පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2014 අය වැය ඇස්තමේන්තුව අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයට රුපියල් 184,000.00 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

ඒ අනුව රජයේ සහනාධාර පොහොර වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම හා එහි අරමුණ හා ඉලක්කයන් සපුරාගැනීම සඳහාත්, 1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනතේ, විධිවිධානයන් දිස්ත්‍රික්කය තුල නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම සඳහාත් ඒ පිළිබඳ දැනුවත් භාවය හා අවබෝධය අදාළ නිලධාරීන් වෙත ලබා දීම අත්‍යාඅවශ්‍ය විය. ඒ අනුව එම ප්‍රතිපාදන මඟින් දිස්ත්‍රික්කය පුරා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩමුළු ගණනාවක් පැවැත්වීය.

2) තොග සත්‍යාපනය හා පොහොර ගබඩා පරීක්ෂාව.

රජයේ සහනාධාර පොහොර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පොහොර ගබඩා හා ගොවි ජන සංවර්ධන මධ්‍යස්ථාන සතු පොහොර ගබඩා පරීක්ෂා කරමින් තොග තත්ත්වයන් වාර්තා කළ යුතු වේ. එමෙන්ම දිස්ත්‍රික්කය තුල පොහොර අලෙවිකරුවන් සඳහා බලපත්‍ර ලබාදීමේ දී පොහොර අලෙවි කරුවන්ගේ ගබඩාවල යෝග්‍යතාව පරීක්ෂා කළ යුතුය. ඒ අනුව තොග සත්‍යාපනය හා ගබඩා පරීක්ෂාව සඳහා දරණ ලද වියදම රු.36,000.00 කි.

3) පාංශු පරීක්ෂාව.

භෝග වගාවේ දී පාංශු නියැදි ලබාගෙන විශ්ලේෂණය කොට එම තත්වයන් හඳුනා අවශ්‍යතාව පරිදි පොහොර යෙදීම ඉතා වැදගත් වේ. ඒ අනුව දිස්ත්‍රික්කයේ විවිධ කලාපයන් හඳුනා ගනිමින් පාංශු නියැදි ගෙන පර්යේෂණ ආයතනයක් වෙත ලබාදී විශ්ලේෂණය කරවා ගැනීම සඳහා ලබා දී තිබූ රු. 10,000.00 ක ප්‍රතිපාදන වලින් රු. 2,410.00 ක් යොදා ගන්නාලදී.

4) පොහොර නියැදි ලබාගැනීම හා තත්ත්ව විශ්ලේශණය.

